www.agaram.lk

21934

AL/2019/32/S-I(OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.08 / 0830 - 1030

ව්‍යාපාර අධ්‍යයනය I
வணிகக் கல்வி I
Business Studies I

32 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.
* ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
* ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

**විභාග අංකය :** ..................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| I පත්‍රය සඳහා | |
|---|---|
| **ප්‍රශ්න අංක** | **ලකුණු** |
| **01 - 30** | |
| **31 - 50** | |
| **එකතුව** | |

| | **අත්සන** | **සංකේත අංකය** |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අධි. ප්‍රධාන පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |

**1.** මිනිස් අවශ්‍යතා සහ වුවමනාවන්ගේ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - සීමිත වීම　　B - කැමැත්ත මත පදනම් වීම
C - පොදු වීම　　D - කාලය අනුව වෙනස් වීම
E - නිර්මාණය කළ හැකි වීම　　F - අත්‍යවශ්‍ය වීම
G - දිගුකාලීන වීම

ඉහත දැ අතුරෙන් අවශ්‍යතාවන්ට පමණක් අදාළ ලක්ෂණ ඇතුළත් වරණය කුමක් ද?

(1) A, C, F, G　　(2) A, D, F, G　　(3) B, D, E, F
(4) C, D, F, G　　(5) C, D, E, F　　(......)

**2.** සමාජීය හා සංස්කෘතික පරිසරයට අයත් මූලිකාංග නිවැරදිව ඇතුළත් වරණය තෝරන්න.

(1) විශ්වාස, අගනාකම්, තාක්ෂණය හා සම්මත
(2) අගනාකම්, ආයතන, වයස් ව්‍යුහ හා සම්ප්‍රදායන්
(3) සිරිත් විරිත්, අගනාකම්, සංවිධාන ව්‍යුහ හා සම්ප්‍රදායන්
(4) විශ්වාස, අගනාකම්, සිරිත් විරිත් හා රෙගුලාසි
(5) විශ්වාස, අගනාකම්, සිරිත් විරිත් හා සම්ප්‍රදායන්　　(......)

**3.** භාණ්ඩ හා සේවාවලට ආවේණික ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - විවිධ බව　　B - වෙන් කළ නොහැකි බව
C - ගබඩා කළ හැකි බව　　D - ආපසු යැවිය හැකි බව
E - අස්පෘශ්‍ය බව　　F - නෂ්‍ය බව

ඉහත දැ අතුරෙන් සේවාවන් සඳහා පමණක් අදාළ වන ලක්ෂණ ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, D, F　　(2) A, B, E, F　　(3) B, C, D, E　　(4) B, C, E, F　　(5) C, D, E, F　　(......)

**4.** කළමනාකරුවකු තම වගකීම ලෙස ප්‍රකාශ කරන ලද්දේ "ව්‍යාපාරයට සාධාරණ ඉපැයුමක් ලබාදෙන අතර ම ආයතනය ආසන්නයේ ජීවත් වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය ද උසස් කරලීම ය." මෙම ප්‍රකාශය මගින් වඩාත් හොඳින් ගම්‍යවන ආයතනය වගකිව යුතු පාර්ශ්ව වන්නේ,

(1) සමාජය හා ගනුදෙනුකරුවන්　　(2) අයිතිකරුවන් සහ සේවකයන්
(3) අයිතිකරුවන් සහ සමාජය　　(4) අයිතිකරුවන් සහ ගනුදෙනුකරුවන්
(5) අයිතිකරුවන් සහ රජය　　(......)

[ දෙවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



5. කිසියම් භාණ්ඩයක කල් ඉකුත්වීමේ දිනය සඳහන් නොකිරීම තුළින් උල්ලංඝනය වන්නේ පාරිභෝගිකයාගේ කුමන අයිතිවාසිකම ද?
(1) මූලික අවශ්‍යතා සපුරාගැනීමට ඇති අයිතිය
(2) තෝරාගැනීමට ඇති අයිතිය
(3) පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය
(4) තොරතුරු දැනගැනීමට ඇති අයිතිය
(5) ආරක්ෂාව සලසාගැනීමට ඇති අයිතිය (......)

6. පහත වගුවේ සමාගම් වර්ග හා එම සමාගම්වල ලක්ෂණ කිහිපයක් දැක්වේ.

| සමාගම් වර්ග | ලක්ෂණ |
|---|---|
| (i) සීමාසහිත පෞද්ගලික සමාගම් | A - කොටස් හා ණයකර ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකි වීම |
| (ii) සීමාසහිත පොදු සමාගම් | B - ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කර විදේශයන්හි පමණක් ව්‍යාපාර කටයුතු කිරීම |
| (iii) ඇපයෙන් සීමිත සමාගම් | C - කොටස්කරුවන්ගේ වගකීම අසීමිත වීම |
| (iv) සීමාරහිත සමාගම් | D - ලාභ බෙදාහැරීමක් නොකිරීම |
| (v) අක්වෙරළ සමාගම් | E - කොටස් හා ණයකර ප්‍රසිද්ධියේ නිකුත් කළ නොහැකි වීම |

ඉහත දී ඇති සමාගම් වර්ග අනුපිළිවෙළ අනුව සමාගම්වල ලක්ෂණ නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) C, A, D, E, B (2) C, D, A, B, E (3) D, E, B, C, A
(4) E, A, D, C, B (5) E, C, D, A, B (......)

7. ව්‍යාපාරවලට අදාළ ලක්ෂණ සමහරක් පහත දැක්වේ.
A - නීතිමය අවශ්‍යතා අවම වීම
B - අඛණ්ඩ පැවැත්ම
C - අසීමිත වගකීම
D - අන්‍යෝන්‍ය ඒකගතාවය
E - ව්‍යාපාරය නමින් බදු ගෙවීම

ඉහත ඇ අතුරෙන් හවුල් ව්‍යාපාරයක ලක්ෂණ පමණක් අඩංගු වන වරණය කුමක්ද?
(1) A, B, E (2) A, C, D (3) B, C, D (4) B, D, E (5) C, D, E (......)

8. ක්‍රීඩා උත්සව සංවිධානය කිරීමේ ආයතනයක් තම ප්‍රදේශයේ නොමැති බව අවබෝධ කරගත් කාන්ති ක්‍රීඩා පාඨමාලාවක් හැදෑරීමෙන් පසුව තම මිතුරකුගෙන් ලබාගත් රු. 25 000ක ණය මුදලක් ආයෝජනය කර ක්‍රීඩා උත්සව සංවිධානය කිරීමේ ආයතනයක් ආරම්භ කරන ලදී. ඉහත තොරතුරු අනුව කාන්ති සතුව ඇති ව්‍යවසායකත්ව නිපුණතා ගණන වනුයේ,
(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. 4) 4 කි. (5) 5 කි. (......)

9. ඒකක භාරයන්හි ආයෝජනය කිරීම තුළින් ආයෝජකයාට ලැබෙන වාසියක් වනුයේ,
(1) ආයෝජන සඳහා ඉහළ ප්‍රතිලාභයක් හිමි වීම ය.
(2) ඒකක භාරයෙහි කළමනාකාරිත්වයට සම්බන්ධ විය හැකි වීම ය.
(3) ප්‍රසාද කොටස් ලබාගැනීමට හිමිකමක් පැවතීම ය.
(4) ඕනෑම අවස්ථාවක දී දඩ මුදල් නොගෙවා ආයෝජනය කළ මුදල ආපසු ගත හැකි වීම ය.
(5) ආයෝජන ප්‍රතිලාභ මත ආදායම් බදු ගෙවිය යුතු නොවීම ය. (......)

10. චෙක්පත් රේඛනය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) රේඛනය නොකරන ලද චෙක්පතක් ආදායකයා හට රේඛනය කළ හැක
(2) ආදායකයාට තම අත්සන යොදා චෙක්පතෙහි ඇති රේඛනය අවලංගු කළ හැක
(3) රේඛනය කරන ලද සියලු ම චෙක්පත් පිටසන් කර අන් අයකුට පැවරිය හැක
(4) රේඛනය සහිත සෑම චෙක්පතකට ම බැංකු කවුන්ටරයෙන් මුදල් ලබා ගත හැක
(5) මුදල් චෙක්පත් රේඛනය කළ නොහැක (......)

11. මධූරි A සහ B නමැති රක්ෂණ සමාගම් මගින් අනුපිළිවෙළින් රු. 300 000 හා රු. 400 000 වශයෙන් ජීවිත රක්ෂණ ඔප්පු දෙකක් ලබාගෙන නියමිත පරිදි රක්ෂණ වාරික මුදල් ද ගෙවා ඇත. රක්ෂණ කාලසීමාව තුළ දී මධූරි මියගියහොත් ලබාගත හැකි වන්දි මුදල වන්නේ,
(1) රු. 300 000 කි. (2) රු. 350 000 කි. (3) රු. 400 000 කි.
(4) රු. 700 000 කි. (5) වන්දි ඉල්ලීමට හිමිකමක් නොමැත. (......)

[ තුන්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



12. ප්‍රවාහනයේ මූලිකාංග නිවැරදිව ඇතුළත් වන වරණය කුමක් ද?
(1) මාධ්‍යය, බලය, මාර්ගය, පර්යන්තය
(2) මාධ්‍යය, බලය, පිරිවැය, වේගය
(3) මාධ්‍යය, පර්යන්තය, පිරිවැය, වේගය
(4) මාධ්‍යය, බලය, මාර්ගය, වේගය
(5) ධාරිතාව, මාර්ගය, පර්යන්තය, බලය (......)

13. මානව සම්පත් කළමනාකරුවකු විසින් රැකියා පුරප්පාඩුවක් පිළිබඳව පුවත්පත් දැන්වීමක් පිළියෙල කරන ලෙසට තම විධායක නිලධාරියකු වෙත විද්‍යුත් තැපැල මගින් දන්වනු ලැබී ය.
ඉහත සන්නිවේදනය සිදු වූ ආකාරය නිවැරදිව දක්වා ඇති පිළිතුර කුමක් ද?
(1) තිරස් - විධිමත්
(2) ඉහළ සිට පහළට - විධිමත්
(3) පහළ සිට ඉහළට - විධිමත්
(4) ඉහළ සිට පහළට - අවිධිමත්
(5) තිරස් - අවිධිමත් (......)

14. 'සුපිරි වෙළෙඳසැල' යන්න වඩාත් නිවැරදිව නිර්වචනය කර ඇති ප්‍රකාශය කුමක් ද?
(1) අත්‍යවශ්‍ය සහ පහසු භාණ්ඩ ස්වයං සේවා පදනම මත සිල්ලර වශයෙන් අලෙවි කරන වෙළෙඳසැලකි
(2) එක් නිෂ්පාදකයෙකුගේ භාණ්ඩ බෙදාහැරීම සඳහා රට පුරා ශාඛා වෙළෙඳසැල් පවත්වාගන්නා වෙළෙඳසැලකි
(3) එක් නිෂ්පාදකයෙකුගේ භාණ්ඩ පමණක් අලෙවි කිරීමට එකඟ වී ඇති වෙළෙඳසැලකි
(4) එක ම ගොඩනැගිල්ලක් තුළ එක් එක් භාණ්ඩ වර්ගය සඳහා වෙන වෙන ම අංශ පවත්වාගෙන යනු ලබන වෙළෙඳසැලකි
(5) විශාල ප්‍රමාණයෙන් භාණ්ඩ තොග රඳවාගෙන ඒවා තොග වශයෙන් අලෙවි කරන වෙළෙඳසැලකි (......)

15. ඇඟළුම් නිෂ්පාදන ආයතනයක මෝස්තර නිර්මාණය, රෙදි කැපීම, රෙදි මැසීම, පරීක්ෂාව සහ ඇසුරුම් කිරීම යනුවෙන් දෙපාර්තමේන්තු පිහිටුවා ඇත. මෙම දෙපාර්තමේන්තුකරණයේ පදනම කුමක් ද?
(1) ක්‍රියාවලි
(2) ශ්‍රිත
(3) නිෂ්පාදන
(4) මිශ්‍ර
(5) ගනුදෙනුකාර (......)

16. විද්‍යුත් ව්‍යාපාර හා සම්බන්ධ **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ගනුදෙනු වේගවත් වීම
(2) තෝරාගැනීමට හැකි වීම
(3) මිල ගණන් සැසඳීමට හැකි වීම
(4) ඇණවුම් කාලය අවම වීම
(5) භාණ්ඩ ආපසු යැවීම පහසු වීම (......)

17. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාවිත කරනු ලබන ගුණාත්මක ණය පාලන ශිල්පීය ක්‍රමයක් වනුයේ,
(1) ණය සඳහා උපරිම පරිණත කාල සීමාවක් නියම කිරීම ය.
(2) වාණිජ බැංකු වෙත සපයන ණය සඳහා පොලී අනුපාතය ඉහළ දැමීම ය.
(3) ණයවර ලිපි නිකුත් කිරීමේ දී තැන්පත් කළ යුතු අවම මුදල් ප්‍රමාණය නියම කිරීම ය.
(4) වාණිජ බැංකු විසින් ලබාදෙනු ලබන ණය ක්ෂේත්‍ර සීමා කිරීම ය.
(5) ණය සඳහා උපරිම ණය සීමා පැනවීම ය. (......)

18. පාරිභෝගිකයකු නව නිෂ්පාදනයක් පිළිබඳ අදහසක් නිෂ්පාදකයකුගේ වෙබ් පිටුවක යෝජනාවක් ලෙස පළ කිරීමෙන් අනතුරුව නිෂ්පාදකයකු එම අදහස මත නව නිපැයුමක් ඇති කරන ලදී. මෙම අදහස වඩාත් නිවැරදිව දැක්වෙන විද්‍යුත් වාණිජ්‍ය ආකෘතිය කුමක් ද?
(1) B2B (2) B2C (3) C2C (4) G2C (5) C2B (......)

19. XYZ සමාගමේ ස්ථාවර පිරිවැය රු. 60 000කි. A නමැති භාණ්ඩ ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා දරනු ලබන විචල්‍ය පිරිවැය රුපියල් 1.00 කි. මෙම භාණ්ඩයේ ඒකකයක විකුණුම් මිල රුපියල් 3.00 ක් නම්, රුපියල් 50 000 ක ලාභයක් ලබාගැනීම සඳහා නිපදවිය යුතු මුළු නිෂ්පාදන ඒකක ප්‍රමාණය කොපමණ ද?
(1) 20 000
(2) 30 000
(3) 40 000
(4) 50 000
(5) 55 000 (......)

20. ණය කාඩ්පත හා සැසඳීමේ දී හර කාඩ්පත භාවිතයෙහි ඇති වාසියක් වනුයේ,
(1) මුදල් භෞතික වශයෙන් රැගෙන යා යුතු නොවීම ය.
(2) ප්‍රමාද වී ගෙවීමට හැකි වීම ය.
(3) කාඩ්පත් හිමියා ණයකරුවකු බවට පත් නොවීම ය.
(4) මුදල් ගෙවීම සඳහා කාඩ්පත් ඉදිරිපත් කළ යුතු වීම ය.
(5) ගිණුමේ මුදල් නොමැති වුව ද භාණ්ඩ මිල දී ගත හැකි වීම ය. (......)

[ හතරවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**21.** පහත වගුව මගින් දැක්වෙන්නේ සීතා විසින් යෝගට් නිෂ්පාදනයේ ගුණත්වය පවත්වාගෙන යාම සඳහා අනුගමනය කරන ලද තත්ත්ව පාලන ශිල්පීය ක්‍රම සහ ක්‍රියාමාර්ග කිහිපයකි.

| තත්ත්ව පාලන ශිල්පීය ක්‍රම | ක්‍රියාමාර්ග |
|---|---|
| (i) තත්ත්ව ආරක්ෂණය | A - නිරතුරුව ම නිෂ්පාදනය පිළිබඳ ගැටලු සාකච්ඡා කිරීම සඳහා සේවක කණ්ඩායම් පිහිටුවීම |
| (ii) තත්ත්ව කව | B - නිෂ්පාදන ක්‍රියාවලියේ සෑම අදියරක ම ගුණාත්මකභාවය නිරන්තරව අධීක්ෂණයට ලක් කිරීම |
| (iii) ශුන්‍ය දෝෂ | C - නිෂ්පාදනය සඳහා සෑමවිට ම නිවැරදි අමුද්‍රව්‍ය භාවිත කිරීම |
| (iv) ගුණත්ව ප්‍රමිති | D - සංවිධානයේ සියලු ම ක්‍රියාවලින්හි ගුණත්වය තහවුරු කර ගැනීමට කටයුතු කිරීම |
| (v) සමස්ත ගුණත්ව කළමනාකරණය | E - සෑමවිට ම නිෂ්පාදන 100%ක ගුණත්වයෙන් පවත්වාගැනීමට අඛණ්ඩව උත්සාහ දැරීම |

ඉහත දී ඇති තත්ත්ව පාලන ශිල්පීය ක්‍රම අනුපිළිවෙළ අනුව අදාළ ක්‍රියාමාර්ග නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, B, E, D, C (2) A, C, B, D, E (3) B, A, E, C, D
(4) B, C, D, E, A (5) E, B, C, D, A (......)

**22.** හැකිතාක් අවම පිරිවැයකින් භාණ්ඩ නිෂ්පාදනය කර වෙළෙඳපොළ තුළ එම භාණ්ඩ සුලභ කිරීමට ව්‍යාපාරිකයකු දරන උත්සාහය වඩාත් හොඳින් නිරූපණය වන්නේ කුමන සංකල්පය මගින් ද?

(1) අලෙවිකරණ සංකල්පය (2) සමාජීය අලෙවිකරණ සංකල්පය (3) විකුණුම් සංකල්පය
(4) නිෂ්පාදිත සංකල්පය (5) නිෂ්පාදන සංකල්පය (......)

**23.** නිෂ්පාදිතයක් සම්බන්ධ පාරිභෝගික වටිනාකම් ධූරාවලියේ අංග පහත දැක්වේ.

A - හර ප්‍රතිලාභ
B - වැඩි දියුණු කළ නිෂ්පාදිත
C - මූලික නිෂ්පාදිත
D - අපේක්ෂිත නිෂ්පාදිත
E - විභව නිෂ්පාදිත

පාරිභෝගික වටිනාකම් ධූරාවලිය නිවැරදිව අනුපිළිවෙළට දක්වා ඇති වරණය තෝරන්න.

(1) A, B, D, C, E (2) A, C, D, B, E (3) B, A, E, C, D
(4) B, E, A, C, D (5) C, A, B, D, E (......)

**24.** විශේෂිත භාණ්ඩයක් මිලට ගැනීමේ දී පාරිභෝගිකයකු කෙරෙහි බලපෑම් ඇති කරන සාධකය තෝරන්න.

(1) අලෙවිකරුවන් (2) විකුණුම් ප්‍රවර්ධනය
(3) සන්නම් නාම පක්ෂපාතීත්වය (4) භාණ්ඩ සුලභත්වය
(5) මිල (......)

**25.** මානව සම්පත් සැලසුම්කරණ ක්‍රියාවලියෙහි පළමු පියවර කුමක් ද?

(1) රැකියා විස්තරය හා රැකියා පිරිවිතරය අධ්‍යයනය කිරීම
(2) මානව සම්පත් ඉල්ලුම පිළිබඳව පුරෝකථනය කිරීම
(3) මානව සම්පත් සැපයුම පිළිබඳව පුරෝකථනය කිරීම
(4) උසස්වීම් තුළින් පිරවීම සඳහා ඇති පුරප්පාඩු සංඛ්‍යාව ඇස්තමේන්තුගත කිරීම
(5) විශ්‍රාම ගැනීමට නියමිත සේවක සංඛ්‍යාව ඇස්තමේන්තුගත කිරීම (......)

**26.** කළමනාකරුවකු විසින් ගනු ලැබූ තීරණ කිහිපයක් පහත දැක්වේ.

A - වෙළෙඳ ණයහිමියන් පිළිබඳ තීරණ B - මුදල් කළමනාකරණය පිළිබඳ තීරණ
C - ගෙවිය යුතු වියදම් පිළිබඳ තීරණ D - වෙළෙඳ ණයගැතියන් පිළිබඳ තීරණ
E - වෙළෙඳ තොග පිළිබඳ තීරණ F - බැංකු අයිරාව පිළිබඳ තීරණ

ඉහත ඇ අතුරෙන් කෙටිකාලීන ආයෝජන තීරණ පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, E (2) A, C, F (3) B, C, F (4) B, D, E (5) C, D, E (......)

[ පස්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**27.** පහත වගුවේ තොරතුරු පද්ධති වර්ග හා ඒවාට අදාළ උදාහරණ දක්වා ඇත.

| තොරතුරු පද්ධති වර්ග | උදාහරණ |
|---|---|
| (i) ගනුදෙනු සැකසුම් පද්ධති (TPS) | A - පුරෝකථන වාර්තා ලබා දීම |
| (ii) කාර්යාල ස්වයංකරණ පද්ධති (OAS) | B - දෛනික තොග වාර්තා ලබා දීම |
| (iii) කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) | C - විද්‍යුත් තැපැල් පහසුකම් ලබා දීම |
| (iv) තීරණ උපකාරක පද්ධති (DSS) | D - වැටුප් වාර්තා සැකසීම |
| (v) විධායක උපකාරක පද්ධති (ESS) | E - ආයෝජන ඇගයීම් වාර්තා ලබා දීම |

ඉහත දී ඇති තොරතුරු පද්ධති වර්ග අනුපිළිවෙළ අනුව උදාහරණ නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) B, C, E, D, A (2) C, D, E, A, B (3) D, C, B, E, A
(4) D, E, A, B, C (5) E, A, B, C, D (……)

**28.** පහත වගුවේ පරිගණක ජාල වර්ග හා ඒවා පිළිබඳව විස්තර කිහිපයක් දක්වා ඇත.

| පරිගණක ජාල වර්ග | විස්තර |
|---|---|
| (i) ශාක ජාල | A - සියලු ම පරිගණක පොදු පථයකට සෘජුව සම්බන්ධ කිරීම |
| (ii) දෙමුහුන් ජාල | B - සෑම පරිගණකයක්ම තවත් පරිගණක දෙකකට සම්බන්ධ කිරීම |
| (iii) බස් ජාල | C - එක් මධ්‍ය පරිගණකයකට සෙසු පරිගණක සම්බන්ධ කිරීම |
| (iv) තාරකා ජාල | D - පරිගණක මධ්‍ය පරිගණකයකට ගසක අතු විහිදී යන ආකාරයට සම්බන්ධ කිරීම |
| (v) මුදු ජාල | E - වෙනස් මූලික පරිගණක ජාල වර්ග දෙකක් හෝ වැඩි ගණනක් එකිනෙකට සම්බන්ධ කිරීම |

පරිගණක ජාල වර්ග අනුපිළිවෙළ අනුව ඊට අදාළ විස්තරය නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) C, D, A, E, B (2) C, E, D, A, B (3) D, B, C, A, E
(4) D, B, C, E, A (5) D, E, A, C, B (……)

**29.** අන්තර්ජාල සැපයුම් සේවාවක් **නොවන්නේ** කුමක් ද?
(1) චන්ද්‍රිකා තාක්ෂණය (2) වෙබ් සේවා (3) විද්‍යුත් තැපෑල
(4) සන්නිවේදන සේවා (5) වීඩියෝ සම්මන්ත්‍රණ (……)

**30.** ව්‍යාපාර සැලැස්ම පිළිබඳ මගපෙන්වීමක් ලබාදීම සඳහා පිළියෙල කරනු ලබන සාරාංශය වන්නේ,
(1) විධායක සාරාංශයයි. (2) පිරිවැය සාරාංශයයි.
(3) මුදල් ප්‍රවාහ සාරාංශයයි. (4) ආදායම් සාරාංශයයි.
(5) ණය පිළිබඳ සාරාංශයයි. (……)

- අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **සුදුසු වචනය/වචන** යොදා හිස්තැන් පුරවන්න.

**31.** (අ) ලාභය අරමුණු කරගත් නමුත් ලියාපදිංචිය **අනිවාර්ය නොවන** ව්‍යාපාර සංවිධාන වර්ග දෙකක් වන්නේ ……………………… සහ ……………………… ව්‍යාපාරයන් ය.

(ආ) ව්‍යවසායකයකු සාමාන්‍යයෙන් ……………………………… අරමුණු කරගෙන ව්‍යාපාර ආරම්භ කරන අතර, සමාජීය ව්‍යවසායකයකු ……………………………… අරමුණු කරගෙන ව්‍යාපාර ආරම්භ කරයි.

**32.** (අ) කළමනාකරණයේ දී නිවැරදි දේ සිදු කිරීම ……………………………… වන අතර කළ යුතු දේ නිවැරදිව කිරීම ……………………………… වේ.

(ආ) මින්ස්බර්ග්ගේ භූමිකා වර්ගීකරණය අනුව කළමනාකරුවකු විසින් නව ව්‍යාපෘති හඳුන්වාදීම ……………………… භූමිකාවෙහි ……………………… උපභූමිකාවට අයත් වේ.

**33.** (අ) තොග පාලනයේ මූලික අරමුණ ……………………………… තොග මට්ටම් පවත්වාගෙන යාම හා තොග ……………………………… ගැනීමේ පිරිවැය අවම කරලීම ය.

(ආ) සේවක යෙදවුම් හා ……………………………… අතර සම්බන්ධතාව ……………………………… ඵලදායීතාව ලෙස හඳුන්වනු ලැබේ.

[ හයවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**34.** (අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයක ඇතුළත් ක්‍රියාකාරකම් මූලිකව .................................... හා .................................... වශයෙන් වර්ග කළ හැක.

(ආ) දිගුකාලීන මූල්‍ය තීරණ .................................... ව්‍යුහය හා .................................... පිළිබඳ තීරණ ලෙස වර්ග කළ හැක.

**35.** (අ) රජය විසින් ණය සඳහා පොලී ගෙවීම් .................................... වියදමක් වන අතර රෝහලක් ඉදිකිරීම .................................... වියදමක් වේ.

(ආ) ආනයන භාණ්ඩවලින් ඒකකයක් මත ස්ථාවරව අයකරනු ලබන්නේ .................................... තීරුබදු වන අතර භාණ්ඩයේ අගය අනුව අය කරනු ලබන්නේ .................................... මත තීරුබදු වේ.

**36.** (අ) තාක්ෂණික කුසලතා ඉතා වැදගත් වනුයේ .................................... කළමනාකරුවන් හට වන අතර .................................... කුසලතා සියලු ම මට්ටමේ කළමනාකරුවන් හට එක සමානව වැදගත් වේ.

(ආ) සේවකයින් වෙත .................................... සහ .................................... විධිමත්ව පවරාදීමේ ක්‍රියාවලිය බලතල පැවරීම ලෙස හැඳින්වේ.

**37.** (අ) වරලත්ලාභියා විසින් දළ .................................... වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස වරලත් හිමියා වෙත ගෙවිය යුතු වන්නේ .................................... වේ.

(ආ) රේගු බන්දිත ගුදම් තුළ දී ආනයනය කළ භාණ්ඩ සඳහා වටිනාකමක් එකතු කිරීමෙන් පසුව අපනයනය කිරීම .................................... වෙළෙඳාම වන අතර ආනයනය කරන උපකරණ භාවිතයෙන් පසුව නැවත එම රට වෙත යැවීම .................................... අපනයනය වේ.

**38.** (අ) නිෂ්පාදනය කරන ඒකක සංඛ්‍යාව අනුව වෙනස් වන්නේ .................................... පිරිවැය වන අතර නිශ්චිත නිෂ්පාදන ඒකක සංඛ්‍යාවක් තුළ වෙනස් නොවන්නේ .................................... පිරිවැය වේ.

(ආ) ව්‍යාපාර සැලැස්මක් මගින් ව්‍යාපාරයක .................................... ද ඒවා ළඟා කර ගැනීමට භාවිත කළ යුතු .................................... ද විස්තර කෙරේ.

**39.** (අ) නිෂ්පාදකයකු විසින් එකම සන්නමක් යටතේ භාණ්ඩ පෙළක් ඉදිරිපත් කිරීම .................................... සන්නම ලෙස හඳුන්වන අතර නියමිත වෙළෙන්දෙකු වෙනුවෙන් සන්නමක් නිර්මාණය කිරීම.................................... සන්නම ලෙස හැඳින්වේ.

(ආ) ඉලක්ක ඉපයීම මත මිල කිරීමේ දී .................................... පදනම් වන අතර පවත්නා මිල මත මිල කිරීමේ දී .................................... පදනම් වේ.

**40.** (අ) විදේශීය වෙළෙඳාමේ දී මුදල් ගෙවීම සඳහා බැංකු .................................... හා .................................... ලිපිය යොදා ගත හැකි වේ.

(ආ) ඇසුරුමක මූලික අරමුණ වනුයේ භාණ්ඩයේ .................................... වුව ද වර්තමානයේ එය .................................... උපකරණයක් ලෙස ද භාවිත වේ.

● අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **නිශ්චිත පිළිතුරු** සපයන්න.

**41.** කේවල ස්වාමි ව්‍යාපාරයක වාසි හා අවාසි **දෙක** බැගින් ලියන්න.

| **වාසි** | **අවාසි** |
|---|---|
| 1. | 1. |
| 2. | 2. |

[ හත්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**42.** තොග පාලනය හා සම්බන්ධ පහත සමීකරණයහි අඩංගු අක්ෂර මගින් අදහස් කරන්නේ කුමක් ද?

$$EOQ = \sqrt{\frac{2cd}{h}}$$

1. ***EOQ*** : ..........................................................................................................

2. ***c*** : ..........................................................................................................

3. ***d*** : ..........................................................................................................

4. ***h*** : ..........................................................................................................

**43.** නව සේවකයකු තෝරාගැනීමේ දී සංවිධානයකට භාවිත කළ හැකි පසුබිම් පරීක්ෂණ වර්ග **හතරක්** සඳහන් කරන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

3. ..........................................................................................................

4. ..........................................................................................................

**44.** පහත දැක්වෙන එක් එක් ක්‍රියාකාරකම සඳහා ගැළපෙන මානව සම්පත් කළමනාකරණ කාර්ය හිස්තැන මත ලියන්න.

1. රැකියා විස්තරය හා පිරිවිතරය සැකසීමට අවශ්‍ය තොරතුරු රැස් කිරීම ..............................

2. නව සේවකයින් හට සංවිධානය පිළිබඳ වීඩියෝ පටයක් ප්‍රදර්ශනය කිරීම ..............................

3. මානව සම්පත් ඉල්ලුම හා සැපයුම පුරෝකථනය කිරීම ..............................

4. සේවක නිපුණතා වර්ධනය කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම ..............................

**45.** මූල්‍ය සැලසුමක ඇතුළත් විය යුතු ප්‍රධාන අංග **හතරක්** සඳහන් කරන්න.

1. .............................................. 2. ..............................................

3. .............................................. 4. ..............................................

**46.** ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍ර ලබාගත යුතු ආයතන **හතරක්** නම් කරන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

3. ..........................................................................................................

4. ..........................................................................................................

**47.** අන්තර්ජාලය මගින් ව්‍යාපාරිකයකුට ලබාගත හැකි වාසි **හතරක්** ලියන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

3. ..........................................................................................................

4. ..........................................................................................................

[ අටවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk




**48.** විද්‍යුත් තොරතුරු පද්ධතියක ඇති දෘඪාංග සඳහා නිදසුන් **හතරක්** ලියන්න.


1. ................................................................................................................
2. ................................................................................................................
3. ................................................................................................................
4. ................................................................................................................

**49.** ලාභ දායකත්ව අනුපාත **හතරක්** නම් කරන්න.

1. ............................................. 2. .............................................
3. ............................................. 4. .............................................

**50.** පහත සඳහන් එක් එක් සංකේතයේ අදහස ලියන්න.

1.  ..........................................................................

2.  ..........................................................................

3.  ..........................................................................

4.  ..........................................................................

***

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

www.agaram.lk

1934

AL/2019/32/S-II(OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ව්‍යාපාර අධ්‍යයනය II
வணிகக் கல்வி II
Business Studies II

32 S II

2019.08.13 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) (අ) නිෂ්පාදිතයක් සඳහා ඉල්ලුම ඇතිවීම කෙරෙහි බලපාන සාධක **හතරක්** නම් කරන්න.

(ආ) කළමනාකරුවකු තරගකාරී ව්‍යාපාරික ආයතන කෙරෙහි උනන්දු වීමට බලපාන හේතු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) අලුතින් ඉදිකරන ලද විශාල වෙළෙඳ සංකීර්ණයක් මගින් ප්‍රාදේශීය ප්‍රජාව වෙත ලැබිය හැකි වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) ශ්‍රිතමය පදනම මත නිර්මාණය කරන ලද සංවිධාන ව්‍යුහය යනු කුමක් දැයි පැහැදිලි කර, එහි ඇති වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)

(iv) (අ) SWOT (ශ. දු. අ. ත) විශ්ලේෂණය තුළින් ව්‍යාපාරිකයකු හට ලබාගත හැකි වාසි **හතරක්** දක්වන්න.

(ආ) ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් භාවිත කර ව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා රජයෙන් බලපත්‍රයක් ලබාගත යුතු ව්‍යාපාර **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) සමාජ වගකීම් ඉටු කිරීම තුළින් ව්‍යාපාරයක් සඳහා ලැබෙන වාසි **හතරක්** සඳහන් කරන්න.

(ආ) ව්‍යාපාර සංවිධානයක් තම ගනුදෙනුකරුවන් වෙත ඉටු කළ යුතු සමාජ වගකීම් **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**2.** (i) (අ) පෞද්ගලික අංශයේ ව්‍යාපාර කටයුතු වර්ධනය කරලීම උදෙසා ශ්‍රී ලංකා රජය මගින් ගනු ලබන ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න.

(ආ) සෘජු බදු හා වක්‍ර බදු අතර වෙනස්කම් **දෙකක්** සඳහන් කර, එක් එක් බදු වර්ගය සඳහා උදාහරණය බැගින් දක්වන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය තුළින් සුළු හා මධ්‍ය පරිමාණ ආයතන වෙත ලබාගත හැකි සේවා **හතරක්** සඳහන් කරන්න.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම උදෙසා භාවිත කරනු ලබන ප්‍රතිපත්ති පොලී අනුපාත වර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) අන්තර්ජාතික වශයෙන් පිළිගත් පාරිභෝගික වගකීම් **හතරක්** සඳහන් කර, ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) විධිමත් ව්‍යාපාර සංවිධානයක් අවිධිමත් ව්‍යාපාර සංවිධානයකින් වෙන් කර හඳුනාගත හැකි ලක්ෂණ **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

[ දෙවැනි පිටුව බලන්න.

agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk



(v) (අ) ශ්‍රී ලංකා රජය ව්‍යාපාර කටයුතුවල නියුක්ත වීම කෙරෙහි බලපාන හේතු **දෙකක්** උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ආ) රාජ්‍ය සංවිධාන පෞද්ගලීකරණය කිරීම තුළින් මහජනතාවට ලැබිය හැකි වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**3.** (i) "ශ්‍රී ලංකාව තුළ කාන්තා ව්‍යවසායකයින් සීමිත ය." කාන්තා ව්‍යවසායකත්ව සහභාගිත්වය වර්ධනය කරලීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) සිරිමලී විසින් තම ප්‍රදේශයේ බහුලව ලබාගත හැකි කෙසෙල් කෙඳි භාවිත කර කාන්තා අත් බෑග්, හිස්වැසුම් හා වෙනත් විසිතුරු නිර්මාණ නිපදවීමේ ආයතනයක් රු. 50 000ක මුදලක් ආයෝජනය කර ආරම්භ කරන ලදි. ඇය විසින් තම ප්‍රදේශයේ රැකියා විරහිත තරුණියන් තිදෙනකුට එම නිෂ්පාදන පිළිබඳ පුහුණුවක් ලබාදීමෙන් අනතුරුව දෛනිකව රු. 800 බැගින් ගෙවීමේ පදනම මත සේවයට බඳවා ගන්නා ලදි. එසේම තම නිෂ්පාදන සංචාරක හෝටල් තුළ අලෙවි කිරීමට ද කටයුතු සිදු කරන ලදී. මෙම සිද්ධිය තුළ ඇති සමාජීය හා ආර්ථික ප්‍රතිලාභ මොනවා දැයි දක්වන්න. (ලකුණු 04 යි)

(iii) (අ) 'ක්ෂණික ප්‍රතිචාර කේත' (Quick Response Code) භාවිතය මගින් ව්‍යාපාරිකයකුට ලබාගත හැකි වාසි **දෙකක්** දක්වන්න.

(ආ) විද්‍යුත් මුදල් පසුම්බිය (e-wallet) භාවිත කර ජංගම දුරකථනයකින් ගනුදෙනු සඳහා මුදල් ගෙවීමේ දී පුද්ගලයකු විසින් සපුරා තිබිය යුතු මූලික කරුණු **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ගනුදෙනුකරුවන් වෙත වාණිජ බැංකු මගින් ලබාදෙන ණය, කාලය අනුව වර්ග කරන ආකාර **දෙක** උදාහරණ සහිතව විස්තර කරන්න.

(ආ) ශ්‍රී ලංකා ස්වයං රැකියා උත්පාදන ණය යෝජනා ක්‍රමයෙහි (SEPI) අරමුණු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ කාර්ය **හතරක්** සඳහන් කරන්න.

(ආ) ප්‍රතිරක්ෂණය තුළින් රක්ෂකයාට හා රක්ෂිතයාට ලැබෙන වාසි **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**4.** (i) ශ්‍රී ලංකා දුම්රිය ප්‍රවාහන සේවයේ ඇති දුර්වලතා **හතරක්** දක්වා, එක් එක් දුර්වලතාවය මගහරවා ගැනීමට විසඳුම් යෝජනා කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ව්‍යාපාර කටයුතු සඳහා සන්නිවේදනය වැදගත් වන ආකාර **දෙකක්** සඳහන් කරන්න.

(ආ) පණිවුඩයක් වාචිකව සන්නිවේදනය කිරීමේ දී එය වෙනස් වීමට බලපාන හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)

(iii) (අ) විද්‍යුත් සන්නිවේදනය මගින් ව්‍යාපාරිකයකුට හිමිවන වාසි **හතරක්** සඳහන් කරන්න.

(ආ) දේශීය වෙළෙඳාමේ ප්‍රධාන ප්‍රභේද **දෙක** දක්වා, ඒවා අතර ඇති වෙනස්කම් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) "ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ දී ස්වයං සේවා වෙළෙඳාම ජනප්‍රිය වෙමින් පවතී." මෙම වෙළෙඳාම මගින් වෙළෙන්දන්ට හා පාරිභෝගිකයින්ට අත්වන වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)

(v) (අ) විදේශ වෙළෙඳාමේ දී භාවිත වන තීරුබදු නොවන බාධක **දෙකක්** විස්තර කරන්න.

(ආ) හානි රක්ෂණ ලිපියක් නිකුත් කිරීමේ අරමුණ පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[ තුන්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

www.agaram.lk



## II කොටස

**5.** (i) (අ) තොග පාලනය සඳහා භාවිත කරනු ලබන 'ABC විශ්ලේෂණය' විස්තර කරන්න.

(ආ) භාණ්ඩයක ගුණත්වය තීරණය කිරීමේ දී නිෂ්පාදකයා හා පාරිභෝගිකයා විසින් සලකා බලනු ලබන සාධක **දෙක** බැගින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) රස කැවිලි නිෂ්පාදනය කර බෙදාහරින අමිලා, තම නිෂ්පාදන සඳහා සුදුසු සන්නාමයක් නිර්මාණය කිරීමට අදහස් කරයි. මෙහි දී ඇය විසින් සැලකිය යුතු ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) ප්‍රවර්ධන ක්‍රමයක් ලෙස පෞද්ගලික අලෙවිය වඩාත් උචිතවන අවස්ථා **හතරක්** සඳහන් කරන්න.

(ආ) ශීත කළ ආහාර සඳහා බෙදාහැරීමේ මාර්ගයක් තෝරාගැනීමේ දී සලකා බැලිය යුතු සාධක **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) මාංගත (online) මිලට ගැනුම් ක්‍රමයෙන් පාරිභෝගිකයාට ඇති වාසි **දෙකක්** හා සීමා **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)


(v) (අ) මුදල් අයවැය ලේඛනයක් පිළියෙල කිරීම තුළින් ලබාගත හැකි වාසි **දෙකක්** විස්තර කරන්න.

(ආ) "කෙටිකාලීන මූල්‍ය සම්පාදන මාර්ග මගින් ලද අරමුදල් දිගුකාලීන ආයෝජනවල යෙදවීම ව්‍යාපාරයකට අවාසිදායක විය හැකි ය." එසේ වීමට හේතු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**6.** (i) ගැටලුවකට විසඳුම් ලබාදීමේ දී විවිධ විකල්ප ඇගයීමෙන් පසුව හොඳ ම විකල්පය ක්‍රියාත්මක කිරීම කළ යුතු වේ. ක්‍රියාත්මක කිරීමේ පියවර තුළ ඇතුළත් විය යුතු කාර්ය **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) පහත දැක්වෙන්නේ සංවිධාන සටහනක කොටසකි.




(අ) 'පාලන අවකාශය' යන්න පැහැදිලි කර, දී ඇති සංවිධාන සටහන අනුව අලෙවි කළමනාකරුගේ පාලන අවකාශයේ තරම දක්වන්න.

(ආ) ඉහත සංවිධානයෙහි දෙපාර්තමේන්තුකරණ පදනම හඳුනාගෙන, එහි වාසි **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)

(iii) (අ) මූල්‍යමය නොවන අභිප්‍රේරණ ක්‍රම **හතරක්** නම් කරන්න.

(ආ) ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලිය තුළ ඇති හිතකර ලක්ෂණ **දෙකක්** හා අහිතකර ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) 'සහගාමී පාලනය' සහ 'පසු පෝෂණ පාලනය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න.

(ආ) ව්‍යාපාර සංවිධානයකට පර්යේෂණය හා සංවර්ධනය වැදගත් වීමට හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(v) "මෝටර් රථ නිෂ්පාදනයේ දී වැඩි වශයෙන් යොදාගනුයේ ප්‍රවාහ නිෂ්පාදන ක්‍රමයයි." මෙම ක්‍රමය මෝටර් රථ නිෂ්පාදනය සඳහා භාවිත කිරීමෙන් ලැබෙන වාසි **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[ හතරවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**7.** (i) (අ) 'මූලික ප්‍රසිද්ධ නිකුතුවක්' (IPO) යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද?

(ආ) රජයේ සුරැකුම්පත්වල ආයෝජනය තුළින් ආයෝජකයකු වෙත ලැබෙන වාසි **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) කොළඹ කොටස් හුවමාරුවෙහි ගනුදෙනු වන සුරැකුම්පත් වර්ග **හතරක්** නම් කර, ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) 'සියලු කොටස් මිල දර්ශකය' යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) 'රැකියා නිර්මාණය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) ආයතනයකට අලෙවි සහකරුවන් බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කිරීමට තීරණය කරන ලදී. මෙසේ පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්කරුවන් ආකර්ශනය කර ගැනීමේ ඇති වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) "සම්මුඛ පරීක්ෂණ ක්‍රමය සේවකයින් තෝරාගැනීම සඳහා භාවිත කරන ජනප්‍රිය ක්‍රමයකි." මෙම ක්‍රමයේ ඇති සීමා **දෙකක්** විස්තර කරන්න.

(ආ) 'සේවක පිරිවැටුම' සමග 'සේවක ප්‍රවාසිතාව' යන්න සංසන්දනය කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**8.** (i) සන්නිවේදන තාක්ෂණය විකාශනය වූ ආකාරය ආර්ථික හා සමාජයීය සංවර්ධන යුග අනුව විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) දත්ත, තොරතුරු හා සංසන්දනය කරන්න.

(ආ) 'දැනුම් සේවකයින්' යන්න පැහැදිලි කර, එවැනි සේවකයින් සඳහා උදාහරණ **දෙකක්** සපයන්න. (ලකුණු 04 යි)

(iii) (අ) සංවිධානයක් සඳහා තොරතුරු කළමනාකරණයේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) ව්‍යාපාරිකයකුට ව්‍යාපාර සැලැස්මක් වැදගත් වීමට හේතු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) අලෙවි සැලැස්මක ඇතුළත් විය යුතු මූලිකාංග විස්තර කරන්න.

(ආ) තරගකාරිත්ව විශ්ලේෂණයේ දී අවධානය යොමු කළ යුතු සාධක **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(v) ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය තුළ අඩංගු වන 'මෙහෙයුම් පෙර වියදම්' යන්න පැහැදිලි කර, ඒ සඳහා උදාහරණ **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

* * *

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk